දැන් ඉරිදා

# මව්රට


උපුල් ජෝසප් ප්‍රනාන්දුගේ

**ගුරුදු විග්‍රහය**

## ඇපත් නැතිව පරදින ලංකාවේ දෙවැනි ඇමැති මණ්ඩලය

P » 04



2019 දී මව්රට මංගල කලාපය හිටපු අටමස්ථානාධිපති අති පූජ්‍ය පල්ලේගම සිරිනිවාස මහ නාහිමියන්ට පිළිගන්වමින්...





# සජිත්-අනුර විවාදය රටම බලාසිටී

## විකාශය ගන්න හිරු-දෙරණ-සිරස මහා සටනක

## සජිත්-මම ලෑස්තියි

## අනුර-ප්‍රතිචාරයක් නෑ

P » 04

## ටිකෙන් ටික ටිකෙන් ටික

### අපි ආවද මේ තරම් දුර...

අපි අවුරුදු පහක් අකුරු අමුණලා අපේ කණ්ඩායම මේ විඳින්නෙ අස්වැන්න ගෙට ගත්ත ගොවියෙකුගෙ සතුට. කණ්ඩායමක් විදියට අපි පත්තර හැදුවා. දැවැන්ත පත්තර පටන්ගන්න කොට අපි එකට හිටියා. ඒවා වැට්ටුවා. අපිට රිදුණා. අපි අකුරු විතරක් එක්ක පාරට බැස්සා. ලොකු ව්‍යාපාර එක්ක හැප්පෙන්න අපිට බැරි බව දැන දැනම අපි අපේ වැඩක් පටන් ගත්තා.

විශාල ප්‍රාග්ධනයක් හිමි ව්‍යාපාර රේස් එකේ ඉස්සරහින්ම දිව්වා. අපි හෙමින් ගියා. කවුරුත් අපි ගැන නොහිතපු කාලයක් තිබ්බා. හුඟාක් අයට අපිව අමතක වෙමින් තිබ්බා. අපිත් එක්ක හිටියේ පාඨක ඔබ පමණයි...

ඒ අතරෙ කොවිඩ් ආවා. මුළු ලෝකෙම නතර වුණා. කඩදාසි නැතුව ගියා. කඩවල් වැහුවා. මිනිස්සු ජීවත් වෙන්න විදියක් හෙව්වා. අපිත් ඒ මිනිස්සුත් එක්කම වහලා දාපු රටක හුදෙකලා වුණා. වෙන වෙන ලයින් වෙනුවට අපි Online වුණා. අපිව එක සතියක දී කියවන ප්‍රමාණය ලක්ෂ අටක් වුණා.

අපේ වෙබ් එක වෙබ් ශ්‍රේණිගත කිරීම්වල පළමු සීයට ආවා. අපි මුළු රටටම පත්තරය බෙදන අස්සෙ මේ හැම දේම කළා.

P » 05

# මැති ඇමැතිවරු ගණනාවක් රුසියන් ගණිකාවෝ එක්ක ඉඳලා



## හිටපු රුසියානු තානාපති හෙළිදරව්වකට ලෑස්තියි

P » 04

## මාලිංග උඹත් අපේ වීරයෙක්

P » 06



## අවුරුදු කාලා හමාරයි



**ප්‍රේමලාල් විජේරත්න**

පසුගිය 2023 වසරේ අවුරුදු සමයට සාපේක්ෂව මම වසරේ අවුරුදු සමයේ භාණ්ඩ සහ සේවාවල මිල ගණන් තවදුරටත් ඉහළ ගොස් ඇති බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කළ සංඛ්‍යා ලේඛනවලින් අනාවරණ වන බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත අතුකෝරල මහතා 'මව්රට'ට පැවැසීය.

2023 මාර්තු මාසයට සාපේක්ෂව 2024 මාර්තු මාසය තුළ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් 2.28%කින් ඉහළ යෑමක් පෙන්නුම් කරන බවද ඔහු සඳහන් කළේය.

## ආණ්ඩුව කඩාගෙන විජේදාස එළියට එනවා

### තවත් 5 දෙනෙක් පෙළ ගැසෙති



සිය අධිකරණ අමාත්‍ය ධුරය අතහැර ආණ්ඩුවෙන් ඉවත් වීමට විජයදාස රාජපක්ෂ මහතා තීරණය කොට ඇති බව විශ්වාස කටයුතු ආරංචි මාර්ගයකින් දැනගන්නට තිබේ.අමාත්‍යවරයා සමග තවත් මැති ඇමැතිවරු පස් දෙනකු ආණ්ඩුවෙන් ඉවත් වීමට තීරණය කොට ඇති බවද එම විශ්වාස කටයුතු අරංචි මාර්ග සඳහන් කරයි.

P » 05




MOBILE

රු. 988 දින 29ක් සඳහා | UNLIMITED | ඕනෑම ජාලයකට UNLIMITED CALLS | ඕනෑම ජාලයකට 1000 SMS | වැඩිපුර ඩේටා 30GB (දවසකට 1.03GB)

රු. 288 දින 7ක් සඳහා | UNLIMITED | ඕනෑම ජාලයකට UNLIMITED CALLS | ඕනෑම ජාලයකට 1000 SMS | වැඩිපුර ඩේටා 7GB (දවසකට 1GB)

අදාළ මුදල රීලෝඩ් කර පැකේජය ඇක්ටිවේට් කරගන්න.

TRC/M/PRO/23/05

HEALTHIER, LONGER, BETTER LIVES

# AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ජයග්‍රාහීන්ට සුබ පැතුම්!










AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන, 1994 වසරේ දී අධ්‍යන විශිෂ්ටත්වය දිරිමත් කිරීමේ අරමුණින් අරඹන ලද අතර එය ශ්‍රී ලංකාවේ වැඩිම කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යන සමාජ සත්කාරක ව්‍යාපෘතියකි. සෑම වසරකම 5 වසර ශිෂ්‍යත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයන් 25 දෙනෙක් AIA වෙතින් ඔවුනගේ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යාධාර මුදලකට සුදුසුකම් ලබයි. මෙම ශිෂ්‍යත්වයේ විශේෂත්වය වන්නේ ඒ සඳහා සුදුසුකම් ලැබීමට ශිෂ්‍යත්වලාභීන්ගේ දෙමව්පියන් AIA ඉන්ෂුවරන්ස් හි සේවාලාභීන් වීම අත්‍යාවශ්‍ය නොවීමත් එය ශිෂ්‍යන්ගේ දක්ෂතාවය මත පමණක් පදනම් වීමත්ය. මෙවර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබාදීමේ උත්සවය අතිදක්ෂ විද්වතෙකු වන මහාචාර්ය අජිත් ද අල්විස් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුන අතර ඔහු විසින් පැමිණ සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ඔවුනගේ දෙමව්පියන් සමගින්, සාර්ථක අනාගතයක් සඳහා පිළිපැදිය හැකි වැදගත් ඔවදන් රාශියක් බෙදා ගන්නා ලදී.


























අපිට ගැළපෙන
හොඳම සෞඛ්‍ය රක්ෂණය
මම අරගත්තා
HNB ASSURANCE
SupremeHealth Unlimited
සැමට ඉහළින් - හොඳම සෞඛ්‍ය සැලසුම
වැඩි විස්තර සඳහා
1301
වසරකට රුපියල් මිලියන 75ක් දක්වා ආවරණයක්
ඔබේ පවුලටත්, දෙමව්පියන්ටත් පූර්ණ සෞඛ්‍ය සැලසුමක්
සීමාවන් රහිත රෝහල් වියදම් පියවීම
ලොවපුරා Cashless හිමිකම් ගෙවීම්
No Claim Benefit + Restore Benefit ඇතුළු ප්‍රතිලාභ රැසක්
HNB ASSURANCE GROUP
HNB General Insurance
www.hnbassurance.com
HNB Assurance PLC (PQ 108), තුන්වන මහල, අයිස්ලන්ඩ් ව්‍යාපාර මධ්‍යස්ථානය, නො.30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ 03.


www.pabcbank.com
(011) 4 667 222
හිතේ තියෙන වැඩේ කරනකම්,
අතේ තියෙන සල්ලි පොඩි කාලෙකට තියන්න
හොඳම තැනක්ද හොයන්නේ?
පෑන් ඒෂියා
CHAMPION SAVER
ඉතුරුම් ගිණුම
පොඩි කාලෙකට සුපර්
011 4 667 222
*කොන්දේසි සහිතයි
පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
සමාගම් ලියාපදිංචි අංකය PQ48. ෆිච් රේටින් BBB-(LKA) Stable Outlook
පෑන් ඒෂියා බැංකුව
සැබවින්ම ශ්‍රී ලාංකීයයි


රත්ති
නුවණක්කාර
අවුරුදු වාසි!
මසයකට සරිලන රත්ති කිරිපිටි*
රු. 100,000/- මුදල් තෑගි*
රු. 10,000/- ක විදුලිය හෝ වතුර බිල්පත් පියවීම*
PAID
පස්වන සතියේ ලක්ෂපතියන්
Ramakrishnan Gunasegaran
W.G Ravisha Piumini
Malini Shakila
Sithara Madhushani
Kalum Ranasinghe
Manel
Chandralatha
H.K Dinusika Privadarshani
Iresha Chandrani
Sabdaruwani Lakmali
Malingani Chathurika
Gavathri Dissanayake
Imalsha Pramod
Shashika Niroshani
A.A Niroshini
H Nihal Privadewa
D.M.M.P.K Dunusinghe
Ramar Subaashini
R.G Sanula Shenal Kumara
සතිපතා ජයග්‍රාහකයින්
ඇතුළත ඇසුරුමෙහි L අකුරෙන් මුද්‍රණය කර ඇති රහස් අංකය 0777 743 743 ට SMS කර ඔබත් අදම තරගයට ඇතුළත් වන්න.
*කොන්දේසි සහිතයි | ජයග්‍රහණය තහවුරු කර ගැනීම සඳහා රහස් අංකය අඩංගු රත්ති ඇසුරුම ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය වේ.
විදුලි හෝ වතුර බිල්පත් පියවීම් හා මසයකට සරිලන කිරිපිටි දිනාගත් ජයග්‍රාහකයින් ගැන විස්තර සඳහා රත්ති Facebook පිටුව පිවිසෙන්න.
RATTHI
කිරි තේ
3in1

මව්රට
ලිපිනය නො: 22, ජයරත්න මාවත, කොළඹ 05
කර්තෘ මණ්ඩලය 0112505134 0114349982
ඊමේල් news@mawratanews.lk
වෙබ් අඩවිය www.mawratanews.lk
බෙදාහැරීම් 0764 449 688
දැන්වීම් 0114349983

උපුල් ජෝසප් ප්‍රනාන්දුගේ

## ගුරුදූ විග්‍රහය

# ඇපත් නැතිව පරදින ලංකාවේ දෙවැනි ඇමැති මණ්ඩලය



සී.පී. ද සිල්වා ඇමැති මණ්ඩලයේදී කිරි වීදුරුව බිව්වේ නැත්නම් දහනායක කවදාවත් ලංකාවේ අගමැති වන්නේ නැත. දහනායක අගමැති වුණේ සී.පී. ද සිල්වා බණ්ඩාරනායක ඝාතනය වීමට පෙර පැවැති ඇමැති මණ්ඩල රැස්වීමේදී විෂ සහිත කිරි වීදුරුවක් බී සිහිසුන්වී වෛද්‍ය ප්‍රතිකාර සඳහා ලන්ඩන් රැගෙන ගිය නිසාය.

ඒ වගේම අගමැතිකම බාරගන්න සජිත්, ගෝඨාභයට ඉවත්ව යන්නැයි නොකිව්වා නම් රනිල් කවදාවත් ජනාධිපති වන්නේ නැත. රනිල් අභියෝග බාරගත්තා යැයි යූ.ඇන්.පී.කාරයන් ගහන කයියට කටඋත්තර නැතිවුණේ තමා සජිත්ට අගමැතිකම බාරගන්න එන්න යැයි කී විට සජිත් අරගලයට හිස නමා ඉවත් වෙන්න යැයි ගෝඨාභය සිය පොතින් හෙළිදරව් කළ නිසාය. ඒ වගේම ඉරාන් වික්‍රමරත්න මෑතකදී කීවේ සජිත් අගමැතිකම බාරගන්න ගෝඨාභය ඉවත්විය යුතු කාලසටහන ගැන තමන් එක් කාමරයක ගෝඨාගේ නියෝජිතයන් සමග සාකච්ඡා කරමින් සිටියදී අනෙක් කාමරයේ රනිල් අගමැති ධුරයේ දිවුරුම් දෙන්න සූදානමින් සිටි බවය. ඔහු කිව්වේ රාජපක්ෂ පවුල රනිල්ව අගමැති කරන්න තීරණය කොට සජිත්ව අන්තන්න බොරුවට සජිත්ට අගමැතිකම බාරගන්න කීවා කියාය.

කොහොම වෙතත් රනිල් අගමැති වුණේත් දහනායක අගමැති වුණා වගේ අහම්බෙනි. දහනායක අගමැති වී ඔහුව අගමැති කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, ශ්‍රීලනිප හිටපු නායක බණ්ඩාරනායකගේ පවුලටත් පහර ගසමින් ඔහු නව දේශපාලන ගමනක් යන්න පටන් ගත්තේය.

පහත දැක්වෙන්නේ දහනායකගේ නව දේශපාලන ගමන ගැන දහනායක ආණ්ඩුවේ හිටපු බණ්ඩාරනායකවාදී ප්‍රබල ඇමැතිවරයෙක් වූ ටී.බී. ඉලංගරත්න කී කතාවය.

"අවමංගල්‍යයෙන් සති කීපයකට පසු අගමැති නිල නිවාසය වූ අරලියගහ මැඳුරේ ඇමැති මණ්ඩල රැස්වීමකදී දහනායක අගමැති අප අමතා තමා දේශපාලන පක්ෂයක් ගොඩනගන්නට තීරණය කරගත් බව කියා සිටියේය.

අප විමතියට පත්වීමු. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ අගමැතිවරයා වෙන පක්ෂයක් ගොඩනගන්නට යෑම නිසයි. නව පක්ෂයේ ප්‍රතිපත්ති වශයෙන් ඔහු ඉදිරිපත් කරන ලද්දේද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පදනම් ප්‍රතිපත්තිවලට හාත්පසින්ම පටහැනි වැඩපිළිවෙළකි.

ඇමැති මණ්ඩලයේ සිටි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් වූ අපේ තත්ත්වය කුමක්දැයි ඇසූ විට පිළිතුරු වශයෙන් ඔහු කීවේ අපටත් ඔහුගේ නව පක්ෂයට බැඳිය හැකි

### තනියම යන්න ගිහින් දහනායකට වෙච්ච දේ

බවත්, එසේ නැතහොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේම සිටිය හැකි බවත්ය.

ඔහුගේ එම ගුණමකු අගරු ප්‍රකාශයත් සමගම ඇමැති මණ්ඩල රැස්වීමද ක්ෂණයකින්ම ඊළඟ දිනයට කල්දමා විසුරුවා හැර නැගී ගියේය.

එදා රෑම 1959 දෙසැම්බර් අටවැනිදා ඔලිවර් ගුණතිලක අග්‍රාණ්ඩුකාරතුමා ලවා අප පස්දෙනකු ඇමැති ධුරවලින් පහ කළේය. ස්වදේශභාර ඇමැති ටී.බී ඉලංගරත්න - ප්‍රවාහන හා විදුලිබල ඇමැති, මෛත්‍රීපාල සේනානායක - සෞඛ්‍ය ඇමැති, ඒ.පී. ජයසූරිය - සංස්කෘතික හ සමාජසේවා ඇමැති, පී.බී.ජී. කළුගල්ල, කම්කරු ඇමැති - ඇම්.පී. සොයිසාත්ය.

එසේම දහනායක ප්‍රිය නොකළ නියෝජ්‍ය ඇමැතිවරු කීප දෙනෙක්ද තනතුරුවලින් පහකරන ලදහ.

බණ්ඩාරනායක ඝාතනය සැලසුම් කළ කුමන්ත්‍රණකාරයන්ගේ අරමුණ වූ ප්‍රතිගාමීත්වය රජකරවීම ඒ ආකාරයෙන්ම එයින් තවත් සාර්ථක විය.

ලංකාව පුංචි එංගලන්තයක් කිරීම එකම අරමුණ කරගත් අග්‍රාණ්ඩුකාර ඔලිවර් ගුණතිලක මහතා දහනායකගේ නියමුවාද, උපදේශකයාද, වධකයාද වූයේය."

දහනායක පළමුවෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තමා ඉවත් වන බව දැන්වීය. ශ්‍රීලනිපය ඔහුගේ ඉල්ලා අස්වීම පිළිනොගෙන ඔහු පක්ෂයෙන් ඉවත් කළේය. ඒ තරහට ඔහු බණ්ඩාරනායකවාදී ශ්‍රීලනිප ඇමැතිවරු ඉවත් කොට පස්දෙනකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් පත්කර ගත්තේය. ඔහුගේ නව පක්ෂයේ නම වූයේ ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයය. 1960 මාර්තු මහ මැතිවරණයට ඔහු තරග වැදුණේ එම පක්ෂයෙනි. රටම මවිතයට පත්කරමින් ඔහුත්, ඔහුගේ පක්ෂයත් මැතිරණයේදී අන්ත පරාජයකට පත්විය. ඔහුගේ පක්ෂයෙන් කිසිවෙක් පාර්ලිමේන්තුවට තේරීපත් වූයේ නැත.

ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අගමැතිත් සමග ඇමැති මණ්ඩලයම පරාජයට පත්වූ ශ්‍රී ලංකාවේ පළමු ඇමැති මණ්ඩලය එය විය. ඔහු ඇමැති ධුරවලින් පන්නා දැමූ බණ්ඩාරනායකවාදී ශ්‍රීලනිප ඇමැතිවරු ශ්‍රීලනිපයෙන් තරග කොට තේරී පත්විය.

දහනායකට වගේම ඇමැති මණ්ඩලයක් දහනායක වගේ අගමැති වී පසුව ජනාධිපති වූ රනිල්ට සිටී. මේ ඇමැති මණ්ඩලයේ ඉන්නා ඇමැතිවරුන්ට පක්ෂයක් නැත. ඊළඟ මහ ඡන්දයේදී තමන් තරග කරන්නේ මොන පක්ෂයෙන්ද කියා මේ ඇමැතිවරු දන්නේත් නැත. මේ ඇමැති මණ්ඩලයේ ඉන්නා සමහරක් වගේම රටේ ජනාධිපතිද ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුය. ඔවුන් ඊළඟට පාර්ලිමේන්තු එන්න ජාතික ලැයිස්තුවක් සොයා ගන්නේ කෙසේද කියා ඔවුන්වත් දන්නේ නැත.

දිනේෂ් ගුණවර්ධනට පක්ෂයක් තිබේ. ඒ, මහජන එක්සත් පෙරමුණය. මහජන එක්සත් පෙරමුණ අවසන් වරට ඡන්දයකට තනිවම තරග කළේ 1994 මහ මැතිවරණයය. 1994 මහ මැතිවරණයට දිනේෂ්, බන්දුල රෝදය ලකුණ යටතේ තරග කළහ. එම මැතිවරණයෙන් මහජන එක්සත් පෙරමුණ අන්ත පරාජයකට පත්විය. දිනේෂ් සහ බන්දුලටත් ඇප නැති විය. චන්ද්‍රිකා කොටි දෙනක් කියා සිංහල බෞද්ධ ජාතිවාදය අවුස්සා ඡන්දය ඉල්ලා අන්ත පරාජයකට පත්වූ මහජන එක්සත් පෙරමුණ 2000 මහ ඡන්දයේදී යළි චන්ද්‍රිකාගේ නායකත්වය යටතේ සන්ධානගත වී ඡන්දය ඉල්ලා පාර්ලිමේන්තුවට තේරී පත්විය. අද වනවිට මහජන එක්සත් පෙරමුණ කියා පක්ෂයක් තියෙන්නේ නමටය. දිනේෂ් සහ මහජන එක්සත් පෙරමුණ ඡන්දය ඉල්ලුවොත් වෙන්නේ 1994 මහ ඡන්දයේදී වෙච්ච දේමය.

අනෙක් හැමෝම ඉන්නේ එල්ලෙන්න වැලක් නැතිවය. සමහරු පොහොට්ටුව රනිල්ව ජනාධිපති අපේක්ෂකයා කළ යුතු යැයි කියති. තවත් සමහරුන් ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ ගැන වචනයක්වත් කතා කරන්නේ නැත. මේ ඇමැති මණ්ඩලය ගෝඨාභය පත්කර ගත්තේ අරගලයට බයේය. ගෝඨාගේ කලින් ඇමැති මණ්ඩලයේ හිටියේ පොහොට්ටු පතාකයන්ය. අරගලයෙන් ඔවුන්ට දැඩි විරෝධතාවක් එල්ල විය. ඒ වෙනකොට ගෝඨාගෙන් ඇමැති ධුරයක් ඉල්ලා එය නොලැබ කෝපයට පත් සුසිල් ප්‍රේමජයන්ත දෙල්කඳ පොළේ ගිහින් බඩු මිල වැඩි යැයි කියා ගෝඨාව විවේචනය කළේය. විජයදාස රාජපක්ෂද ගෝඨාගෙන් ඇමැතිකමක් නොලැබී ගෝඨාගේ ආණ්ඩුවට රිදෙන්න ගැහුවේය. කංචන විජේසේකරලා හිටියේ නාමල්ලා එක්කය. ප්‍රසන්න හිටියේ බැසිල්ලා එක්කය. ගෝඨා අරගලයට බයේ පොහොට්ටු පතාකයන්ගේ කැබිනට් මණ්ඩලය අහෝසි කොට ඔහුට බැණ බැණ ගිය අයව එක්කොට ඇමැති මණ්ඩලය හැදුවේ අරගලයෙන් බේරී ජනාධිපතිකම බේරාගන්නටය. ඒ අතර නාමල්ගේ

### රනිල්ගේ හයියට ගිය ඇමතිවරුන්ට මොනවා වෙයිද

කීමට කංචනවත්, බැසිල්ගේ කීමට ප්‍රසන්නවත් ඇමැති මණ්ඩලයට ගත්තේය. ගෝඨා ඉවත් වූ විට මේ ඇමැති මණ්ඩලය හොල්මන් විය. නායකයෙක් නැති පක්ෂයක් නැති මේ අනාථ වූ අසරණ වූ ඇමැති මණ්ඩලය තියාගන්න රනිල් කැමැති වූයේ රනිල්ටත් තමාගේ පක්ෂයෙන් සිටියේ එක මන්ත්‍රීවරයෙක් වූ නිසාය. මේ ඇමැති මණ්ඩලයම පසුගිය වසර දෙකේම කළේ සිග්නල් කණු මෙන් අත් උස්සන එක විතරය. මේ ඇමැති මණ්ඩලය මුලින් හිතුවේ රනිල් මාර ගේමක් ගහලා තමන්වත් ගොඩ දමයි කියලාය. ඔවුන් හිතාගෙන හිටියේ රනිල් සමගි ජන බලවේගය ගෙඩිය පිටින් ගිලලා එජාපයට යළි පණ දුන් පසු එජාප සන්ධානයට එකතු වෙන්නටය. ඒත් දැන් දැන් රනිල් එක්ක ගිහින් තමන්ටත් යනඑන මං නැති වන බව ඔවුන්ට තේරුම් ගොස් තිබේ. රනිල්ව ජනාධිපතිවරණයට ඉදිරිපත් කරලා රනිල් දිනවන්න ගිහින් රනිල් පරාජය වුවහොත් මේ හැමෝටම පාර්ලිමේන්තු යෑම හීනයකි. රනිල් ජනාධිපතිවරණයට ඉදිරිපත් නොවුණොත් පාර්ලිමේන්තු යන්න පක්ෂයක් සොයාගැනීම කළුනික හොයනවාටත් වඩා අමාරු වනු ඇත.

'ඒ කියන්නේ දහනායකගේ ඇමැති මණ්ඩලයට වෙච්ච දේ මේ ඇමැති මණ්ඩලයටත් වෙයිද...?'

ජේන්නේ නම් ඒ වගේය.

**උපුල් ජෝශප් ප්‍රනාන්දු**




PAGE - 01

## සජිත්-අනුර විවාදය...

රටේ ආර්ථිකය ගොඩනැගීම සම්බන්ධයෙන් සමගි ජන බලවේගයේ නායක සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සහ ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක මහතා අතර පැවැත්වීමට නියමිත සජීවී විවාදය දැකබලා ගැනීම සඳහා රටම උනන්දුවෙන් සිටින ආකාරයක් මේ දිනවල දැකගන්නට ඇත.

මේ ආකාරයට රටේ ආර්ථිකය ගොඩගැනීම සම්බන්ධයෙන් ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලය

ට සජබය සමග විවාදයක් කිරීම සඳහා මුලින්ම අභියෝග කරනු ලැබුවේ සජබ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා විසිනි.

පසුව සජබ ආර්ථික කමිටුව නියෝජනය කරන ආචාර්ය හර්ෂ ද සිල්වා, කබීර් හෂීම් සහ ඉරාන්





වික්‍රමරත්න යන මහත්වරුද මෙම අභියෝගය කරමින් තම කණ්ඩායම සමග විවාදයකට පැමිණෙන ලෙස මාලිමාවේ ආර්ථික කමිටුව නියෝජනය කරන සුනිල් හඳුන්නෙත්ති, ආචාර්ය අනිල් ජයන්ත සහ මහාචාර්ය සීතා බණ්ඩාර යන පිරිසට ප්‍රසිද්ධියේ දැනුම් දීමට පියවර ගත්හ.

නමුත් පසුව ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කරමින් සුනිල් හඳුන්නෙත්ති මහතා කියා සිටියේ සජබ නායක සජිත් ප්‍රේමදාස මහතා සමග ආර්ථිකය සම්බන්ධයෙන් විවාද කිරීමට අනුර කුමාර දිසානායක මහතා සූදානම් බවත්, හැකිනම් එම අභියෝගය භාරගන්නා ලෙසත්ය.

ඊට ප්‍රතිචාර දක්වමින් වහාම සජිත් ප්‍රේමදාස මහතා තමන් එම අභියෝගය භාරගන්නා බවත්, අනුර කුමාර දිසානායක මහතා සමග සජීවීව විවාද කිරීමට සූදානම් බවත් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම විපක්ෂ නායකවරයාගේ මෙම ස්ථාවරය සජබ ආර්ථික කමිටුවද, නලින් බණ්ඩාර මහතාද රට හමුවේ ප්‍රකාශ කිරීමට පියවර ගෙන තිබිණි.

සජබයේ එම ප්‍රතිචාරයත් සමග හිරු, දෙරණ, සිරස ඇතුළු විද්‍යුත් මාධ්‍ය රැසක් එම විවාදය සිය නාලිකාවන්හි විකාශය කිරීමට කැමැත්ත පළකරමින් නිවේදන නිකුත් කිරීමට කටයුතු කොට තිබිණි.

නමුත් තවමත් සජබය ඉදිරිපත් කළ අභියෝගයට ජවිපෙ නායක අනුර කුමාර දිසානායක මහතාගෙන් හෝ මාලිමාවේ ආර්ථික කමිටුවෙන් හෝ ප්‍රතිචාර ලැබී නැත.

## මැති ඇමැතිවරු ගණනාවක්...

පසුගිය කාලය පුරා රුසියාවේ සංචාරය කළ මැති ඇමැතිවරු රැසක්ම රුසියානු ගණිකාවන්ගේ පහස ලබාගෙන ඇති බවට ආන්දෝලනාත්මක හෙළිදරව්වක් රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපතිවරයා වූ උදයංග වීරතුංග මහතා විසින් සිදුකොට ඇත.

මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම මහතා සමග විශේෂ සාකච්ඡාවකට එක්වෙමින් උදයංග වීරතුංග මහතා මේ බව අනාවරණ කර තිබේ.

එම ලැයිස්තුවේ විශාල පිරිසක් සිටින බව සඳහන් කරන වීරතුංග මහතා මෑතකදී රුසියාවට ගිය කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන පොහොට්ටු මන්ත්‍රීවරයකුද එම ලැයිස්තුවේ සිටින බවද සඳහන් කොට ඇත.




# අපලෙ කාන්තාවන්ටමයි



**ප්‍රේමලාල් විජේරත්න**

ජංගම දුරකතන සහ පරිගණක මගින් සිදුකරගෙන යන අපරාධවලින් 63%ක් වින්දිතයන් බවට පත්වන්නේ කාන්තාවන් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය සිදුකළ සමීක්ෂණයකදී හෙළිව තිබේ.

එම විමර්ශන අංශයේ උසස් නිලධාරියකු සඳහන් කළේ මේ රටේ මිලියන 23ක ජනගහනයක් සිටින අතර, ජංගම දුරකතන භාවිතය මිලියන 23 දක්වා ඉහළ නැග ඇති බව අනාවරණ වී ඇති බවයි.

ආරම්භයේ ජංගම දුරකතන භාවිතය ගෙහිමියාට පමණක් සීමාවූ නමුදු එය මේ වන විට අඹුසැමි දෙදෙනාට මෙන්ම දරුවන් අතටද එය පත්ව ඇති බවද සඳහන්ය.

ගෙවීගිය මාස තුන තුළ පරිගණක අපරාධ පිළිබඳ පැමිණිලි සංඛ්‍යාවද ඉහළ ගොස් ඇති අතර, එම සංඛ්‍යාව 1,500ක් බව සඳහන්ය.

නාඳුනන පුද්ගලයන්ගේ රැවැටීම්වලට හසුවී ඇති වින්දිතයන් පිළිබඳ රහස් පොලිසියේ පරිගණක අපරාධ විමර්ශන අංශය යටතේ ඇති මහනුවර, මාතර, අම්පාර සහ කුරුණෑගල යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය විමර්ශන ඒකකද විමර්ශන පවත්වාගෙන යයි.

# ඡන්දෙට පිටරට ඇහැත්

**ප්‍රේමලාල් විජේරත්න**

ලබන ඔක්තෝබර් මාසයේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා වෙනත් මැතිවරණවලට වඩා ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂකයන් වැඩි පිරිසක් මෙරටට ගෙන්වා ගැනීමට සැලසුම් කරගෙන යන බව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'මව්රට'ට පැවැසීය.



ජාත්‍යන්තර නිරීක්ෂකයන් පිරිසක් පසුගියදා ශ්‍රී ලංකාවට පැමිණ පැෆ්රල් සංවිධානය සහ මැතිවරණ කොමසාරිස්වරයාද හමුවී සාකච්ඡා කොට ආපසු ගිය බවද ඔහු සඳහන් කළේය.

ජනාධිපතිවරණය සඳහා ජාත්‍යන්තර නිරීක්ෂකයන් ගෙන්වා ගැනීමට අදාළව පැෆ්රල් සංවිධානය ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය සමග සාකච්ඡා කරමින් සිටින බවද හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

පූර්ව මැතිවරණ කාලයට පෙර රාජ්‍ය දේපළ අවභාවිත කිරීම, රාජ්‍ය බලය අවභාවිත කිරීම පිළිබඳවත්, වෛරී ප්‍රකාශ සිදුකිරීම සම්බන්ධයෙන්ද පැෆ්රල් සංවිධානය දැඩි අවධානයෙන් යුතුව කටයුතු කරන බවද ඔහු සඳහන් කළේය.

දැනට වසර කිහිපයකට පෙර පිහිටුවා ගන්නා ලද 'මාර්තු 12' සංවිධානයට අයත් දිවයින පුරා සිටින සාමාජිකයන් 5000කට අධික පිරිසක් කොළඹට කැඳවා මහ මැතිවරණයකදී අපේක්ෂකයන් තෝරාගැනීමට අදාළව දැනුවත් කිරීමේ සමුළුවක් කොළඹ විහාරමහාදේවි උද්‍යානයේ රඟහල භූමියේදී පැවැත්වූ බවද පැෆ්රල් සංවිධානය පැවැසීය.

# අවුරුද්දටත් පොලිසිය පාරේ



**ප්‍රේමලාල් විජේරත්න**

සිංහල අලුත් අවුරුදු සතිය තුළදී පිට පළාත්වලට යන රියැදුරන්ගේ වේගය, මත්ද්‍රව්‍ය පාවිච්චිය, මාර්ග නීති උල්ලංඝනය කිරීම වැනි රථ වාහන වැරැදි සෙවීම සඳහා සෑම පොලිසියකම රථ වාහන අංශ මගින් දිවා රාත්‍රී විශේෂ පොලිස් කණ්ඩායම් යොදවන ලෙස කොළඹ රථ වාහන පොලිස් මූලස්ථානය පොලිසිවලට නියෝග නිකුත් කොට තිබේ.

මීට පෙර මාසවලදී මාරක රිය අනතුරු සිදුවූ ස්ථාන ලෙස සිතියම්ගත කර ඇති ස්ථාන පිළිබඳ දැඩි අවධානය යොමුකරන ලෙස කොළඹ රථ වාහන පොලිසිය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මනෝජ් රණගල මහතා 'මව්රට'ට පැවැසීය.

බීමත් රියැදුරන් හදිසි වෛද්‍ය පරීක්ෂණවලට ලක්කිරීමත්, ඒ සඳහා අවශ්‍ය බැලූනයන් පොලිසිවලට ලබාදීමට දැනටමත් පියවර ගෙන ඇත.

පසුගිය මාස දෙක තුළ පමණක් දිවයින පුරා සිදුව ඇති හදිසි අනතුරු සංඛ්‍යාව 4,140ක් වන අතර, මාරක රිය අනතුරුවලින් පුද්ගලයන් 500ක් පමණ මියගොස් තවත් 800 දෙනකු පමණ බරපතළ තුවාල ලබා, 1,700ක් පමණ සුළු තුවා ලබා ඇති බවද පොලිසිය පැවැසීය.

PAGE - 01

## ආණ්ඩුව කඩාගෙන...

ඉකුත් සති අන්තයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විධායක සභා රැස්වීමටද අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහභාගි වී සිටි අතර, මාධ්‍ය ඔහුගෙන් ජනාධිපති සටනට ඉදිරිපත් වන්නේද යනුවෙන් කළ ප්‍රශ්න කිරීමේදී ඔහු සඳහන් කර සිටියේ ජනතාව තමන්ගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට තමන් සූදානම් බවකි.

ඒ අනුව, ශ්‍රීලනිපය ප්‍රමුඛ පක්ෂ කිහිපයක සන්ධානයක් මුල්කොට ගෙන විජයදාස රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේ සූදානමින් සිටින බව එම ආරංචි මාර්ග වැඩිදුරටත් සඳහන් කොට සිටී.

## අපි ආවද මේ තරම් දුර...

අපේ කණ්ඩායම හුඟක් පොඩි වුණා. සමහර අය අපිව දාලා ගියා. අමාරු වෙලාවෙ අපිත් එක්ක හිටපු අය තවම ඉන්නවා.

ඉස්සර හුඟාක් අය ඇහුවා 'මව්රට' කියලා පත්තරයක් තියෙනවද කියලා. දැන් අහන්නෙ 'මව්රට' පත්තරේද කියලා. හෙට කියාවි 'මව්රට' තමයි පත්තරේ කියලා. ඒත් අපි අපිමයි. අපි තවම රුපියල් අසූවයි. රටේ හැමදේම මිල වැඩිවෙන අතරෙ අපි මිල වැඩි නොකරම මේ ගමන යනවා.

දැන් එයාට අවුරුදු පහයි. ළමයෙක් වුණා නම් ඉස්කෝලෙ යන්න පටන් ගන්න කාලේ. අම්මලා කියන්නෙ 'ඔය ඩිංග ලොකු කරගත්ත එක තමයි අමාරුම' කියලා. ඔව් එහෙම තමයි. අපිත් 'මව්රට' මේ ටික ලොකු කරගත්තෙ අමාරුවෙන්. ඒත් දැන් එයා ලොකුයි. හයවැනි උපන්දිනයට ඔයත් නොවරදවාම එන්න. ඒක අපි ලොකුවට සමරමු. පහට මේ ඇති...



**2014 අප්‍රේල් 06 වැනිදා ඔබට මතකද? 2014 අප්‍රේල් මාසේ 06 වැනිදා මම හිතන්නේ ගොඩ දෙනකුට මතක නැති දවසක්. හැබැයි එදා තමයි ටී-20 ලෝක කුසලානය අපි දිනපු දවස. සිරිබංගලා ක්‍රීඩාංගණයේදී තමයි මේ ක්‍රිකට් තරගය පැවැත්වුණේ. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව තමයි මේ තරගය සඳහා මුණගැසුණේ. ඒ වෙනකොට ඉතා ප්‍රබලම කණ්ඩායම බවට පත්වෙලා හිටිය ඉන්දියානු කණ්ඩායමට රෝහිත් ෂර්මා, අජින් කේ. රෙහානි, විරාට් කෝලි, යුවරාජ් සිං, එම්.එස්. දෝනි, සුනිල් ෂයිනා, රවීන්ද්‍ර ජඩේජා, රවිචන්ද්‍ර අෂ්වින්, අමිත් මිෂ්රා, බුවනේෂ්වර් කුමාර් සහ මොයින් ෂර්මා ඇතුළත් වෙලා තිබුණා. සමහර විට මේ කණ්ඩායම දිහා බලනකොට ඔබට හිතෙයි මෙතෙක් බිහිවෙච්ච විශිෂ්ටතම කණ්ඩායම මේ කණ්ඩායම කියලා. ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජය කරපු නම් ටික ඇහුවමත් ඔබට එහෙමම හිතෙන්න ඉඩ තියෙනවා. කුසල් පෙරේරා, ටී.එම්. ඩිල්ෂාන්, මහේල ජයවර්ධන, කුමාර සංගක්කාර, ලහිරු තිරිමාන්න, තිසර පෙරේරා, ඇන්ජලෝ මැතිව්ස්, නුවන් කුලසේකර, සචිත්‍ර සේනානායක, රංගන හේරත් සමග ලසිත් මාලිංග තමයි මේ තරගයට සහභාගි වුණේ. මේ තරගය සඳහා සහභාගි වෙන්නට පෙර වඩාත් ඉදිරියෙන් හිටියේ ශ්‍රී ලංකාවද, ඉන්දියාවද කියලා ඇහුවොත් උත්තරේ ඉන්දියාව. ඔවුන් කොහොමත් අපිට වඩා ඉදිරියෙන් ඉන්නවා. ඔවුන් දක්ෂයන් යැයි ලෝකයම විශ්වාස කරනවා.**

මුලින්ම පන්දුවට මුහුණ දුන්නේ ඉන්දියානු කණ්ඩායම. රෝහිත් ෂර්මා පන්දු 26කදී ලකුණු 29ක් ලබාගත්තා. ඔහු එල්ල කළේ 4 පහර 3ක් පමණයි. අජිත් කේ. රෙහානි පන්දු 8කදී ලකුණු 3යි. විරාට් කෝලි වෙනදා වගේම ශ්‍රී ලංකාවට හොඳ උත්තරයක් ලබාදෙමින් 6 පහර 4ක් සමග 4 පහර 5ක් අන්තර්ගත කරමින් පන්දු 58කදී ලකුණු 77ක් ලබාගත්තා. යුවරාජ් සිං සහ එම්.එස්. දෝනි කියන දෙන්නා ශ්‍රී ලංකාව හමුවේ බරපතළ විදියට හිරවෙන අවසාන අවස්ථාව සමහර විට පළමු අවස්ථාව මෙය වෙන්න ඇති. යුවරාජ් සිං පන්දු 21කදී ලකුණු 11යි ලබාගතතේ. ඔහුගේ ස්ට්‍රයික් රේට් එක 52.38යි. එම්.එස්. දෝනිට පන්දු 7කදී ලකුණු 4ක් පමණයි ලබාගන්න ලැබෙන්නේ. ඔහු නොදැවී ක්‍රීඩා කරනවා. අනිත් අන්තයේ හිටපු විරාට් කෝලිට පන්දුවට මුහුණ දීමේ අවස්ථාවක් ලබාදෙන්න මේ දෙන්නටම හැකියාව ලැබෙන්නේ නෑ. කෝලි දුවද්දී දැවී යැමකට හසුවෙනවා. ඒකට හේතු වෙන්නේ කෝලිට මේ අවනඩුව දරාගන්න බැරුව ඔහු එහා පැත්තට එන්න උත්සාහ කරනවා කොහොම හරි.

අපි එතෙක් මෙතෙක් දැකපු හොඳම අවසාන පන්දු වාර කිහිපය එදා යවනවා නුවන් කුලසේකර සමග ලසිත් මාලිංග. කුලසේකර පන්දු වාර 4ක් ලකුණු 29කට යවද්දී, මාලිංග පන්දු වාර 4 ලකුණු 27කට යවනවා. ඒ වගේම සචිත්‍ර සේනානායකගේ විශිෂ්ට පන්දු යැවීම ගැනත් අපි කතා කළ යුතුයි. ඔහු පන්දු වාර 4 ලකුණු 22කට යවනවා.




# අනූහය අනූහය අනූහය කියන්නෙ 2014 අපි දින්නේ ලෝක කුසලානයක් නෙවෙයි ද?



## මාලින්ග පොරක් නෙවෙයිද?

කඩුලු දවාගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. රංගන හේරත් හැමදාම වගේ පන්දු වාර 4 ලකුණු 23කට ඉවර කරලා දෙනවා. ඇන්ජලෝ මැතිව්ස් පන්දු වාර 4 ලකුණු 25කට නිමා කරනවා. මේ සියල්ලත් එක්කම පළමු කඩුල්ල ලකුණු 4දීත්, දෙවැන්න ලකුණු 64දීත් බිඳීයනවා.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන්ට හිසරදයක් වෙයි කියලා හිතපු යුවරාජ් සිං 119දී දැවී යනවා. විරාට් කෝලි ලකුණු 130දී දැවී යනවා. පන්දු වාර 19 නිමා වෙද්දී.

මේ තත්ත්වයත් එක්ක ශ්‍රී ලංකාවට ලැබෙන්නේ ඉතා පහසු ඉලක්කයක්. මේ ඉලක්කය පහසුවෙන් ජයගන්න ලැබේවි කියන එක ගැන අපිට ලොකු බලාපොරොත්තුවක් තිබුණේ නෑ. පළමුවෙන් පන්දුවට පහරදෙන්න පැමිණෙන කුසල් පෙරේරා සහ ටී.එම්. ඩිල්ෂාන් දෙන්නාගෙන් කුසල් පෙරේරා ඉක්මනින් ක්‍රීඩාගාරයට යවනවා ලකුණු 5දී. 41දී ටී.එම්. ඩිල්ෂාන් දැවී යනවා පන්දු වාර 5යි පන්දු 5ක් යවා අවසන් වෙද්දී. බලාපොරොත්තු සියල්ල බිඳහෙළමින් මහේල ජයවර්ධනත් හැකි ඉක්මනින් ක්‍රීඩාගාරයට යවන්න මේ පන්දු යවන්නන් සමත් වෙනවා. මහේල ජයවර්ධන ලබාදුන් උඩපන්දුවක් රවිචන්ද්‍රන් අෂ්වින් ලබගන්නවා. සුරේෂ් රයිනා තමයි පන්දුව යවන්නේ. සුරේෂ් රයිනා පාට් ටයිම් බෝලර් කෙනෙක් විදියට මේ තරගයේදී හොඳින් පන්දු යවනවා. මහේල ජයවර්ධනව ඔහු දවාගන්නවා. ලකුණු 78දී ලහිරු තිරිමාන්න දැවී යනවා. මේ තත්ත්වයත් එක්ක ලංකාව යම් අසීරුතාවකට මුහුණ දෙනවා. මොකද ලකුණු 78දී පන්දු වාර 12යි පන්දු 3ක් යවලා තියෙද්දී තමයි ලහිරු තිරිමාන්න දැවීයන්නේ. මිෂ්රාගේ පන්දුවකට. නමුත් තිසර පෙරේරා සහ කුමාර සංගක්කාර විශිෂ්ට ඉනිමක් දියත් කරමින් තරගය ජයග්‍රහණය වෙත ගෙන යනවා. මෙහිදී සංගක්කාර පන්දු 35කදී ලකුණු 52ක් එක් 6 පහරක් සහ 4 පහර 6ක් සමගින් ලබාගන්නවා.


ජීවන පහන් තිළිණ

තිසර පෙරේරා ලකුණු 23ක් පන්දු 14කට ලබාගන්නවා. 6 පහර 3ක් සමගින්. ඒ තරගයෙන් ශ්‍රී ලංකා කණ්ඩායම ජයග්‍රහණය කරනවා. ලෝක කුසලානය අපට හිමිවෙනවා. ලසිත් මාලිංග ලෝක ශූර කුසලානය රැගෙන අපේ ක්‍රීඩකයන් වෙතට එනවා. බොහෝ කතන්දර තියෙනවා. මහේල ජයවර්ධනලා, කුමාර සංගක්කාරලා පදක්කම් පහුවදා වෙනකල් ගැලෙව්වේ නෑ කියලා කියනවා. මොකද කාලයක් අනූ ශූරයන් වෙමින් ඉඳලා රිදුණු ක්‍රීඩකයෝ තමයි මේ ක්‍රීඩකයෝ. ඒ නිසා ශූරයන් බවට පත්වුණාට පස්සෙ ඒ සතුට අප්‍රමාණව වින්ද බව තමයි ඉතිහාස කතන්දරවල කියන්නේ. ප්‍රශ්නේ තියෙන්නේ අපි තවමත් මාලිංග, අර්ජුන කෙනෙක් විදියට පිළිගන්වාද කියන ප්‍රශ්නය. මාලිංගගේ කොණ්ඩේ නිසාද? මාලිංග තවම තරුණ නිසාද අර්ජුනට දෙන ගෞරවය මාලිංගට නොදෙන්නේ? කතා දෙකක් නෑ 96 ලෝක කුසලානය ඓතිහාසිකයි. ඒක අමතක කරන්න බෑ. ඒක ගෞරවනීයයි. ඒක පූජනීයයි. ඒ සියල්ලම හරි. හැබැයි මේ ලෝක කුසලානය 96 ලෝක කුසලානයට වඩා බර අඩු වුණේ කොයි වෙලාවදෙ? 2014 ලෝක කුසලානය ගැන අපි වන්දනීයව කතා නොකරන්නේ ඇයි කියන එක ගැන අපිට ලොකු ප්‍රශ්නයක් තියෙනවා. අපි විශ්වාස කරනවා මේ 06 වැනිදාත් අපි සමරන්න ඕනේ කියලා. මොකද ලෝකේ ක්‍රිකට්වල ට්‍රෙන්ඩ් එක බවට පත්වෙලා තියෙන්නේ ටී-20. අසීරු ටී-20. ජයග්‍රහණය කොයි මොහොතේ ගිලිහෙයිද කියලා දන්නේ නැති ටී-20. ටී-20වල ලෝක ශූරයන් බවට පත්වෙලා ඉන්නේ ඉන්දියාව. ඉන්දියාව මේ ලෝක කුසලානයත් එක්ක එන ගමනේදී ඔවුන්ගේ හිටපු දැවැන්තයොත් එක්ක මේ සටනට එන්නේ. නමුත් මේ තරගයේදී අපි හිටියේ පිටිපස්සේ. හැබැයි මේ තරගයට යන්නේ ඇත්තටම චන්දිමාල්ගේ නායකත්වයෙන් යුතුව. පසුව තමයි ලසිත් මාලිංග නායකයා බවට පත්වෙන්නේ. විශාල ආන්දෝලනාත්මක දේවල් සිදුවෙච්ච ක්‍රිකට් ලෝක කුසලානයක් මේ විදියට අපි ජයග්‍රහණය කරන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා ඔබට දැන් අමතක වෙලා තිබුණා නම් මතක් වෙයි කියලා අපි එකපාරක් නෙවෙයි දෙපාරක් ලෝක ශූරයෝ වෙච්ච බව.

අපේ ලෝක ශූරයන් බවට පත්වුණේ අර්ජුන රණතුංග දිනපු ලෝක කුසලානයේදී විතරක් නෙවෙයි. මාලිංගගේ කුසලානයත් ලෝක ශූරයා කුසලානයක් බවත්, ඒ කුසලානයේ අභිමානය අර අභිමානය තරම්ම වටිනා බවත් ගෞරවනීය බවත් හිස මත තබාගත යුතු බවත් මේ මොහොතේ අපි ඔබට සිහිපත් කරනවා. මාලිංග තවත් අර්ජුන කෙනෙක් කියලා අපි කියන්නේ නෑ. හැබැයි අර්ජුනට තියෙන ගෞරවයම මාලිංගටත් අපි දෙන්න ඕනේ. හැබැයි එහෙම කියලා 96 ලෝක කුසලානයේ බර අඩු කරන්න ඕනේ කියලා අපි යෝජනා කරන්නේ නෑ. මොකද ඒකට හේතුව ක්‍රිකට්වල බොහොම පුංචි අඩියක හිටපු අපි ක්‍රිකට්වලින් දියුණු වෙමින් හිටපු අපි වරප්‍රසාද නොතිබ්බ අපි තනියම නැගිට්ට අපි 96 දිනාගත්ත ලෝක කුසලානය කවදාවත් හැල්ලුවට ලක්කරන්න හදනවා නෙවෙයි. හැබැයි ඒ අතරතුරේ 96 ලෝක කුසලානය වගේම 2014 ලෝක කුසලාන ජයග්‍රහණයත් ඒ තරම්ම ආඩම්බරයෙන් සමරමු කියලයි අපි ඔබට යෝජනා කරන්නේ. මාලිංගත්, අර්ජුන වගේම වීරයෙක් කරලා ඔහුටත් මල් මිටක් දෙමු කියලා අපි ඔබට යෝජනා කරනවා.

CEEGREEN ENGINEERING
(PVT) LTD

ශ්‍රී ලංකාවේ
ප්‍රථම සහ එකම
ක්ලෝරින් නිෂ්පාදනය
කරන ආයතනය අප වේ.

CEEGREEN ENGINEERING වන අපි
ජල පිරිපහදු කිරීම, රෙදිපිළි සහ අනෙකුත් කර්මාන්ත සඳහා
උසස් තත්ත්වයෙන් යුත් රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන
ශ්‍රී ලංකාවේ විශ්වාසනීයම සැපයුම්කරු වේ.

අපෙන් ඔබට...
▫ Calcium Hypochlorite (Chlorine Powder) ▫ Sodium Hypochlorite (Various Strengths) ▫ Caustic Soda (Solid & Solution) ▫ Hydrated Lime (Food Grade) ▫ Aluminium Sulphate (Drinking Grade) ▫ Poly Aluminium Chloride (Drinking & Wastewater Grade) ▫ Activated Carbon ▫ Hydrogen Peroxide ▫ Sodium Hydrosulphite ▫ Hydrochloric Acid & More...

WWW.CEEGREEN.LK
(සම්පූර්ණ ලැයිස්තුව බැලීම සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න)

සීග්‍රීන් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම
නො. 66/1, වෝල්ටර් ගුණසේකර මාවත, නාවල,

අපව අමතන්න...
දුරකථන: +94 11-2509639
විද්‍යුත් තැපෑල: info@ceegreen.lk
වෙබ් අඩවිය: www.ceegreen.lk

## 71 කැරැල්ල...

PAGE - 15

මහ නඩුවේ ජනප්‍රිය නායකයන් පමණක් නොව සැබෑ ලෙසම ප්‍රහාරයට එක්වූ ඉදිරිපෙළ සටන්කාමීන් සිය ගණනක් දශකයකට ආසන්න කාලයකදී හමුවූ අතර, අලුතින්ම නිකුත්වන ග්‍රන්ථය ඒ පිළිබඳ කළ ගවේෂණාත්මක වාර්තාකරණයකි. ජවිපෙ ආරම්භ වීමට හේතු, එම කාලවකවානුව තුළ තිබූ වෙනත් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් හැටේ දශකයේ අවසාන භාගය සහ කැරැල්ල දක්වා ජවිපෙ විකාශනය විස්තරාත්මකව මෙයට ඇතුළත්ය.

ලේඛකයා ජීවත්ව සිටින එම සියලු නායකයන්ද, ඔවුන් ජීවත්ව නොමැති නම් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ නායකයන් ද දිස්ත්‍රික්ක 17කට ගොස් කළ සාකච්ඡා මෙයට ඇතුළත්ය. මෙම ලිපි මාලාව දත්ත සහ ඓතිහාසික කරුණු රැසකින් පොහොසත් වනු ඇත. වර්තමානයේ ජීවත්වන වයස අවුරුදු 53ට අඩු අය කිසිදා නොදුටු, එහෙත් ඔවුනට අසන්නට පමණක් ලැබුණු 1971 අප්‍රේල් කැරැල්ලේ ඇතුළාන්තය පිළිබඳ සියලු තතු නොදන්නා අයටද ඒ අසම්පූර්ණ සිදුවීම් මාලාව පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මෙම ලිපි මාලාව තුළින් විද්‍යමාන වනු ඇත. මෙතෙක් බොහෝ දෙනා ඇසූ සහ කිය වූ උපකල්පන, විකෘති කිරීම්, වැරැදි වැටහීම් මත වෙනුවට සත්‍ය ඉතිහාසය මෙම ලිපි මගින් විවර කරනු ඇත.

ජවිපෙ 2 වැනි කැරැල්ලද විජේවීරගේ නායකත්වයෙන් 1986 ඇරැඹී 1990 අවසන් වූ අතර, එහිදී මියගිය හෝ අතුරුදන් වූ සංඛ්‍යාව මානව හිමිකම් සංවිධානවල වාර්තාවන්ට අනුව 67,652කි. මින් 6,661ක් කැරැලිකරුවන් අතින් ඝාතනයට ලක්වූ අතර, සෙසු අය ඝාතනයට පත්වූයේ ආරක්ෂක අංශ ඇතුළු එයට ඍජු සහ වක්‍ර සම්බන්ධකම් පැවතුණා යැයි කියන අතුරු හමුදා කණ්ඩායම් 13ක් මගිනි. ජවිපෙ 2 වැනි කැරැල්ල පිළිබඳවද නිරවද්‍ය විස්තරයක් මේ ලේඛකයා ඉකුත් දශකය තුළ සැපයීම හේතුකොටගෙන එම ලිපි මාලාව පුළුල් ලෙස සම්භාවනාවට පාත්‍රවිය.

1971 අප්‍රේල් කැරැල්ලේදී කියත් තලයෙන් අත්පා කැපීමෙන් පසු සිය හිස කඳෙන් වෙන්කර දැම්මේදීත් බද්දේගම, ගිනිමැල්ලගහ කොඩිතුවක්කු මද්දුගේ කමලබන්දු පෑ ජීවගුණය ඔබට මතකයට නැගෙනු ඇත. එමෙන්ම දියේ ගිල්ලවා මරාදමද්දීත් උනන්පිටියේ පදුම හිමියන් පෑ උපේක්ෂාව සිහියට නැගෙනු ඇත. දූෂණය කොට මරාදමද්දීත් කතරගම ප්‍රේමවතී මනම්පේරි සුරක්ෂිත කළ විප්ලවීය සදාචාරය ආවර්ජනය වනු ඇත. එසේ තිරස්චීන අතවර සහ වද බන්ධනවලට ලක්ව ඝාතනය වූ තරුණ තරුණියන්ගෙන් ගලා ගිය උණුසුම් ලේ දහරා පිළිබඳ පමණක් නොව විප්ලවීය ජීවගුණයෙන් පිරිපුන් කැරැල්ලට සහභාගි වීමෙන් සිය අනාගතයම කැපකළ දහස් ගණනක් පිළිබඳ මතකය විනාශ කළ නොහැකි වුවද, පරාජය කළ නොහැකි වුවද අපේක්ෂාවක් බව කියවෙනු ඇත.

1971 අප්‍රේල් කැරැල්ල නවතම ග්‍රන්ථය ඔබ වෙනුවෙන් විවර වන්නේ එකී සැබෑ ඉතිහාසය වත්මන් පරපුර දැනගත යුතු නිසාය.

## බැංකුකරණය සහ ජීවිත රක්ෂණය ඒකාබද්ධ කිරීම

# යුනියන් ඇෂුවරන්ස් බැංකු රක්ෂණය ප්‍රමුඛත්වයට රැගෙන ආවේ කොහොම ද?



සෙනත් ජයතිලක
ප්‍රධාන විධායක නිලධාරී
යුනියන් ඇෂුවරන්ස්

වත්සලා අලුත්ගෙදර
ප්‍රධාන හවුල්කාරිත්ව බෙදාහැරීම් නිලධාරිනී
යුනියන් ඇෂුවරන්ස්

යුනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සෙනත් ජයතිලක සහ ප්‍රධාන හවුල්කාරිත්ව බෙදාහැරීම් නිලධාරිනී වත්සලා අලුත්ගෙදර, සිය සමාගමේ බැංකු රක්ෂණ ක්‍රමෝපාය, රක්ෂණ ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛත්වයට පත් කිරීම සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කළහ.

***යුනියන් ඇෂුවරන්ස් බැංකු රක්ෂණය වෙත ප්‍රවේශ වූයේ කෙසේ ද? එමෙන් ම, ක්ෂේත්‍රයේ ඇති පුළුල් අවස්ථා සපුරාගන්නේ කෙසේ ද?**

**සෙනත්:** ජීවිත රක්ෂණ සමාගම්, අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ මූල්‍ය ආරක්ෂාව ලබා දෙමින් විවිධ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද පුළුල් ආරක්ෂණ විසඳුම් සපයනවා. අනෙක් අතට, මූල්‍ය ප්‍රවේශය සහ සවිබල ගැන්වීම වැඩිදියුණු කරන විසඳුම් පිරිනැමීම සම්බන්ධයෙන් බැංකු විශේෂඥතාවක් උසුලනවා. මේ ආයතන දෙක ගනුදෙනුකරුවන්ගේ ජීවන අවස්ථා මත පදනම් වුණ විවිධ මූල්‍ය අවශ්‍යතා සපුරනවා. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විශ්වාසවන්ත බැංකු සහකරු හරහා එක් ස්ථානයකින් සියලු මූල්‍ය විසඳුම් ලබා දෙන බැංකු රක්ෂණයේ සහයෝගීතා ආකෘතිය හරහා රක්ෂණකරුවන්ගේ සහ බැංකුවල ශක්තීන් ඒකාබද්ධ කරනවා. ගොඩක් ප්‍රධාන වෙළෙඳපොළවල මුළු රක්ෂණ අලෙවියෙන් 50%කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ, බැංකු රක්ෂණවලින්.

ප්‍රධාන බැංකු හවුල්කරුවන් සමග සහයෝගයෙන් අපගේ ගනුදෙනුකරුවන්ට පූර්ව මූල්‍ය සුරක්ෂිතභාවයක් ලබා දීමෙන් ඔවුන්ගේ මූල්‍ය යහපැවැත්ම පොහොසත් කිරීම සඳහා සමාගම මෙම ආකෘතිය ඵලදායී ලෙස භාවිත කරනවා. ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 37කට වැඩි අපගේ පුළුල් අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින්, ශ්‍රී ලංකාවේ බැංකු රක්ෂණ අංශයේ ප්‍රමුඛයා වීම සහ රටේ සෑම ප්‍රදේශයකට ම ප්‍රවේශ වීමට හැකිවීම ගැන අපි ආඩම්බර වෙනවා.

එපමණක් නොවේ, මේ ආකෘතිය ඉදිරියට ගෙන යාම සඳහා, ශ්‍රී ලාංකික බැංකු ගනුදෙනුකරුවන්ට වෙළෙඳපොළේ ඇති වඩාත් ම නව්‍ය සහ විස්තීර්ණ ආරක්ෂණ විසඳුම් ඒකාබද්ධව ලබා දීමට, අපගේ උපාය මාර්ගික බැංකු හවුල්කරුවන් සමග එක්ව, අපගේ රක්ෂණ ක්‍රම පිරිනැමීමේ සහ බෙදාහැරීමේ ආකෘති නව්‍යකරණය කිරීම සහ සියල්ලන්ට ගැළපෙන අයුරින් සකස් කිරීම අපි අඛණ්ඩව කරගෙන යනවා.

***බැංකු රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීමට යුනියන් ඇෂුවරන්ස් සමාගම සතු ප්‍රධාන සැලසුම් අප සමග බෙදා ගත හැකි ද?**

**සෙනත්:** බැංකු රක්ෂණ ක්ෂේත්‍රයේ අපගේ සාර්ථකත්වය සඳහා ප්‍රධාන උපායමාර්ගික ක්ෂේත්‍ර දෙකක් ප්‍රමුඛව දායක වී තිබෙනවා. අපගේ බැංකු හවුල්කරුවන් සමග දැඩි බැඳීමක් සහ සහයෝගීතාවක් පවත්වා ගැනීම කෙරෙහි උපායමාර්ගික වශයෙන් මූලිකව අපගේ අවධානය යොමු වී තිබෙනවා. මේ වන විට අපි පෞද්ගලික බැංකු 12න් 7ක් සමග මෙහෙයුම් කටයුතු කරනවා. ඒ වගේ ම, අවුරුදු 13 කට අධික කාලයක් බැංකු රක්ෂණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සිටිනවා.

ශ්‍රී ලාංකික බැංකු රක්ෂණ ක්ෂේත්‍රය තුළ අපගේ දිගුකාලීන අත්දැකීම් තුළින්, විවිධත්වයෙන් යුත් පාරිභෝගික අංශයක බහුවිධ හවුල්කරුවන් සමග කටයුතු කරමින්, අප ලංකාවේ වෙළෙඳපොළේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා තාක්ෂණික දැනුම, ප්‍රවීණත්වය, යටිතල පහසුකම් සහ ව්‍යාපාරික දක්ෂතා භාවිත කරනවා.

මෙම අවශ්‍යතා කෙරෙහි පමණක් නොව එක් එක් හවුල්කරුට සුවිශේෂී වූ වටපිටාවක් සපයමින් බාධාවකින් තොරව ගැළපෙන නිෂ්පාදන යෝජනා වැඩිදියුණු කිරීම කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා.

දෙවන උපායමාර්ගික ඉලක්කය වන්නේ, නිෂ්පාදන වැඩිදියුණු කිරීම පිළිබඳ අපගේ අඛණ්ඩ පරිණාමයයි. ජීවිත රක්ෂණ විසඳුම් නවෝත්පාදනය කිරීමේ දී අප නිරන්තරයෙන් ප්‍රමුඛත්වය ගෙන තිබෙනවා. අපගේ සේවාවන් මූලික ආරක්ෂාව ඉක්මවා; එම සේවාවන්ට ශක්තිමත් ඉතුරුම් වේදිකාවක් සමග ව්‍යුහගත ආරක්ෂාව, වැඩිදියුණු කළ ආරක්ෂණ විශේෂාංග සහ විස්තීරණ සෞඛ්‍යය ආවරණ ඇතුළත් වෙනවා. මෙම ප්‍රවේශය අපගේ පාරිභෝගිකයින්ගේ වෙනස් වන අවශ්‍යතාවලට සමගාමීව අපගේ විසඳුම් පරිණාමය වන බව සහතික කරනවා.

***එවිධ බැංකු සමග හවුල්කාරිත්වය වැඩිදියුණු කර ගත් ආකාරය සහ බැංකු රක්ෂණ සේවා ක්ෂේත්‍රය ජය ගැනීමේ සාර්ථකත්වයට එම හවුල්කාරිත්වය දායක වී ඇති ආකාරය පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?**

**සෙනත්:** හවුල්කාරිත්ව වපසරිය කළමනාකරණය කිරීම සඳහා අපගේ ප්‍රවේශය, බෙහෙවින් එක් එක් පාර්ශවයට අවශ්‍ය පරිදි සකස් කර ඇති අතර, හවුල්කාර පාර්ශවය කේන්ද්‍රගත වූ එකක්. අපගේ එක් එක් බැංකු හවුල්කරුවන්ට ඔවුන්ගේ ඉලක්කගත විසඳුම් වර්ග සහ ඔවුන්ගේ ප්‍රධාන පාරිභෝගික අංශවල පැතිකඩ වැනි සාධක මඟින් බලපා ඇති අනන්‍ය වූ පාරිභෝගික පදනමක් ඇති බව අපි හඳුනාගෙන තිබෙනවා. එමනිසා, හැමෝට ම ගැළපෙන එක විසඳුමක් පිරිනැමීම වෙනුවට, අපි අපගේ විසඳුම් සෑම හවුල්කරුවෙකුගේ ම පසුබිමට ගැළපෙන ආකාරයට සකස් කරනවා.

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන්ට අනුකූලව සකසන ලද මෙම ප්‍රවේශය, අපගේ පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ බැංකු රක්ෂණ කණ්ඩායම් අතර පවත්නා සමීප සබඳතා සමග බැඳී පවතිනවා. මෙම සහයෝගීතාවයේ ප්‍රධාන අංගයක් තමයි, මූල්‍ය අනාගතය ආරක්ෂා කර ගැනීම සඳහා ජීවිත රක්ෂණ විසඳුම්වල අවශ්‍යතාව සහ එක් එක් පාරිභෝගිකයා සඳහා ස්ථාවර මූල්‍ය පරිසරයක් ගොඩනැගීමේ දී ජීවිත රක්ෂණය ඉටු කරන කාර්යභාරය පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම. ඒ මඟින්, පාරිභෝගිකයින්ට වඩාත් අදාළ සහ සම්පූර්ණ තොරතුරු ලබා දීම සහතික කරමින්, ඔවුන්ගේ රක්ෂණ විසඳුම් පිළිබඳ වඩාත් දැනුවත් තීරණ ගැනීමට අපි ජීවිත රක්ෂණයේ ඇති වටිනාකම ශක්තිමත් කරනවා.

***පාර්ශවකරුවන්ට ප්‍රශස්ත වටිනාකමක් සහතික කිරීම සඳහා යුනියන් ඇෂුවරන්ස් සමාගම, බැංකු සමග සහයෝගයෙන් කටයුතු කරන ආකාරය ඔබට පැහැදිලි හැකි ද?**

**වත්සලා:** ව්‍යාපාරික ඉපැයීම් සහ ශාඛා සංඛ්‍යාව යන අංශ දෙකෙන් ම විශිෂ්ටත්වයට පත්ව සිටින අප, ලංකාවේ බැංකු රක්ෂණ සපයන ආයතන අතර ප්‍රමුඛත්වය උසුලනවා. අපගේ බැංකු හවුල්කරුවන් සමග අප ඇති කර ගන්නා උපායමාර්ගික හවුල්කාරිත්වයන්, අප සේවය කරන පාරිභෝගිකයින් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි ඉලක්කගත වී ඇති අතර, එබැවින් පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඒවාට ගැළපෙන විසඳුම් ලබා දීමට නිවැරදි මෙහෙයුම් ආකෘති අනුගමනය කිරීම අවශ්‍ය වෙනවා.

අපේ ප්‍රවේශයට මූලික වෙන්නේ, පාරිභෝගික කේන්ද්‍රීය අරමුණු වන අතර, විවිධ බැංකුවල පාරිභෝගිකයින්ගේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් අපි ඉතා සියුම්ව සකස් කළ ආරක්ෂණ විසඳුම් සකස් කරනවා. සෑම දෙනෙකුට ම සුදුසු ආකාරයට ඉදිරිපත් කරන එක සැලසුමක් යන සංකල්පය අභිබවා යමින් පාරිභෝගිකයින්ට අසමසම පහසුවක්, විශ්වාසයක් සහ පක්ෂපාතීත්වයක් ලබා දීමට අපි කැපවී සිටිනවා.

මෙම හවුල්කාරිත්වයන් හරහා බැංකුවලට පුළුල්, සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන සමූහයක වාසිය අත්වනවා පමණක් නොව, විස්තීරණ මූල්‍ය විසඳුම් සඳහා සියල්ල එක තැනකින් ලැබෙන ආයතනයක් බවට ද පත්වෙනවා. මේ අනුව, මෙම උපායමාර්ගික සන්ධානගත වීම සෑම පාර්ශවකරුවෙකුට ම සැලකිය යුතු වටිනාකමක් එක් කරන අතර, බැංකුවට, එහි ගනුදෙනුකරුවන්ට සහ අපගේ සමාගමටත් එක සේ සාධාරණ ප්‍රතිලාභ ලබා දෙනවා.

***බැංකු රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ ඔබේ අදහස කුමක් ද? ඒ වගේම සමාගමේ වර්ධනය සඳහා වන සැලසුම් මොනවා ද?**

**වත්සලා:** 2023 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ හැකිලීමක් ගැන ලෝක බැංකුව පුරෝකථනය කර තිබුණත්, මේ වසරේ ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත් වෙන බවට ධනාත්මක හැඟීම් ඇති වෙලා තියෙනවා. පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 සහ මූල්‍ය අර්බුදයේ අභියෝග තිබියදීත්, වෙළෙඳපොළ දැනටමත් වර්ධනයේ ධනාත්මක සලකුණු පෙන්වීමට පටන් ගෙන තිබෙනවා. 2023 වසරේ තුන් වන කාර්තුව වන විට ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ දළ ලිඛිත වාරික 11%කින් වර්ධනය වූ අතර වෙළෙඳපොළ අගයයන් ඉක්මවා යමින් යුනියන් ඇෂුවරන්ස් සමාගමේ එම අගය 14%ක් ලෙස සටහන් වුණා.


ශ්‍රී ලංකාව තුළ, බැංකු රක්ෂණය තවමත් ගෝලීය ප්‍රස්ථාරවලට සාපේක්ෂව ආරම්භක අවධියක පවතින නමුත්, යුරෝපයේ සහ නැගෙනහිර ආසියාවේ වඩා පරිණත වෙළඳපොළවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ බැංකු රක්ෂණය වඩ වඩාත් ජනප්‍රිය වෙමින් පවතිනවා.

වෙළෙඳපොළේ ප්‍රමුඛයා ලෙස, බැංකු රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම ඉපැයීම් සහ විශාලතම බැංකු ශාඛා පද්ධතියක් ඇති යුනියන් ඇෂුවරන්ස් සමාගම ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් සකසයි.

වර්තමානයේදී, අඩු ආදායම්, ඉහළ යන බදු සහ ක්ෂය වූ ඉතුරුම් සමග ආර්ථික වාතාවරණය අභියෝගාත්මකව පවතින අතර, සෞඛ්‍යය වියදම් ඉහළ යාම මූල්‍ය ස්ථාවරත්වයට බලපානවා. මෙය ජීවිත රක්ෂණයේ කාර්යභාරය තවදුරටත් අවධාරණය කරමින් මූල්‍ය ආරක්ෂාව අවධාරණය කරනවා.

2024 වසර සහ ඉන් ඔබ්බට ඉදිරි කාලය දෙස බලා, යුනියන් ඇෂුවරන්ස් සමාගම, ක්ෂේත්‍රයේ නවෝත්පාදන හඳුන්වා දෙමින් ඉදිරියට යාමට සහ නව හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට සැලසුම් කරන අතර ශ්‍රී ලංකාවේ බැංකු රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ශුභවාදීව කටයුතු කරනවා.

## 15 වෙනකන් අමාරුයි



**ප්‍රේමලාල් විජේරත්න**

සූර්යයා ශ්‍රී ලංකාවට ඉහළින් මුදුන්වීම හේතුවෙන් ලබන 15 වැනිදා දක්වා දැඩි උණුසුම්කාරී කාලගුණ තත්ත්වයක් පවතිනු ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අතුල කරුණානායක මහතා පැවැසීය.

පසගිය සතියේ උණුසුම්කාරී කාලගුණ තත්ත්වය තිබියදී බොහෝ ප්‍රදේශවලට ගිගුරුම් සහිත වැසි ඇතිවූ නමුදු එය මේ වන විට පහව යෑම නිසා උණුසුම තවත් වැඩිවන බවයි ඔහු පැවැසුවේ.

ලබන අප්‍රේල් 15 වැනිදායින් පසු (18-20 අතර) කාලගුණ තත්ත්වය වෙනස් වී වෙනදාට වඩා තද වැසි ඇතිවන බවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේය.

එල්නිනෝ කාලගුණ විපර්යාසය මත පසුගිය වසරට වඩා මෙම වසරේ දැඩි උණුසුම්කාරී කාලගුණ තත්ත්වයක් ඇතිවූ බවයි ඔහු පැවැසුවේ.

ලබන මැයි මාසයේ නිරිතදිග මෝසම් සහිත කාලගුණික තත්ත්වය උදාවීමත් සමග, එනම් 25 වැනිදා වනවිට අධික වර්ෂා සහිත කාලගුණික තත්ත්වයක් මතුවන බවට ඔහු අනාවැකි පළකර සිටියේය.

## පාස්කු ප්‍රහාරයට අවුරුදු 5යි

# දින 3ක විවාදයක්

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සභාව කල්තැබීමේ විවාදයක් අප්‍රේල් 24, 25 හා 26 යන තෙදින පුරා පැවැත්වීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය වී තිබේ.

පාර්ලිමේන්තු සන්නිවේදන ඒකකය නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර සිටියේ, නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් එම තීරණය ගත් බවය.

ඒ අනුව අප්‍රේල් 24 වන බදාදා පෙ.ව 9.30 සිට 10.30 දක්වා අපරාධ නඩු සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත (දෙවන වර කියවීම) සහ විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත යටතේ නියෝග විවාදයට ගැනීමට නියමිතය.

අනතුරුව පෙ.ව 10.30 සිට ප.ව 5.30 විරුද්ධ පාර්ශව විසින් ගෙනෙනු ලබන යෝජනාවකට අනුව පාස්කු ඉරු දින සිදුවූ ප්‍රහාරය සම්බන්ධයෙන් සභාව කල්තැබීමේ විවාදය පැවැත්වීමට ද මෙහිදී තීරණය වූ බව වැඩබලන මහලේකම්වරයා පැවසීය.



# ඡන්දයක් නොතිබ්බොත් රට ඉවරයි !

ඡන්දය තියෙනවද කියන සැකය ජනතාවට තියෙනවා. මොකක් හරි දෙයක් කරයිද? කල් දාන්න මොනවා හරි දෙයක් කරයිද? සල්ලි නෑ කියයිද? මේකේ තරකම තැන අපි කල්පනා කරමු. ඡන්දේ තිබ්බෙම නෑ. මොකක්ද වෙන්නේ? එතකොට ඇතිවෙන දේ තමයි ඡන්දය තිබ්බේ නැත්නම් 2024 නොවැම්බර් මාසේ 18 වැනිදා රටේ ජනාධිපතිවරයෙක් නෑ. ඔහු අස්වෙලත් නෑ. අගමැතිවරයෙක් නෑ. කැබිනට් එක අවලංගුයි. පළාත් පාලන ඇමැතිවරයෙක් නෑ. සේනාධිනායකයෙක් නෑ. හමුදාවට අණ දෙන්න කෙනෙක් නෑ. මේක හරි භයානක තත්ත්වයක්. මේක අරාජික වීමක් වෙන්නේ. එහෙම වුණොත් මිනිස්සු පාරට බහීවි. උද්ඝෝෂණ කරාවි. ඒ දේවල් සිද්ධ වෙනවා. රට අරාජික වෙනවා. ලෝක ඉතිහාසයේම සාමකාමීම අරගලයක් සිද්ධ වෙච්ච රටක් මේක. එවැනි තැනකට මේ රට තල්ලු වෙන්නේ නෑ, වෙන්න බැහැ. ඒ නිසා ඡන්දය තියයිද? ඔව් තියනවා. මේ සාකච්ඡාව තුළ පැහැදිලිව කිව හැකි එකම එක දේ රටේ පුරවැසියෙක් හා නීතිඥවරයෙක් හැටියට සැක සංකා තියාගන්න එපා ඡන්දය තියන්න ඕනේ. මේකට වෙන විකල්ප මොනවත් නෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දින වකවානු දීලා තියෙනවා. 1981 අංක 15 දරන ජනාධිපතිවරණය පැවැත්වීමේ පනතේ මැතිවරණය තියන්නේ කොහොමද කියලා තියෙනවා. ඒකට ජනාධිපතිවරයාට හෝ දේශපාලන අධිකාරියට මොනම බලයක්වත් නෑ. ඒක



කරන්න ඕනේ රාජ්‍ය ආයතනය මැතිවරණ කොමිසම තුළින්. ඒක සිද්ධ කරන්නේ නැත්නම් කරන්නේ මොකක්ද කියන එක පිළිබඳ පැහැදිලිව තියෙනවා ඒකට විරුද්ධව නඩු පවරන්න පුළුවන්. 18 වැනිදාට ජනාධිපතිවරයෙක් නැත්නම් මේ රටේ ඇතිවෙන තත්ත්වය මම පැහැදිලි කළේ. ඒ නිසා ජනාධිපතිවරණය නොතියා ඉන්න බෑ. ජනාධිපතිවරයා ඉන්නකල් රට දුවන්න පුළුවන්. නමුත් ජනාධිපතිවරයා නැතිවුණොත්? හරි භයානකයි. ඛේදවාචකයක්.

ඔබතුමා ඇහුවා පාර්ලිමේන්තු මැතිවරණයද ජනාධිපතිවරණයද මුලින් තියන්නේ කියලා. රටේ ජනතාව මේ දෙකෙන් ඕනෙ එකකට ලෑස්තියි. හැබැයි මහ මැතිවරණය කලින් කැඳෙව්වා කියලා ජනාධිපතිවරණය කල්දාන්න බෑ. ඒක පැහැදිලියි. එතකොට ජනාධිපතිවරණය අනිවාර්යයෙන්ම ඒ කාලවකවානුව තුළ තියෙන්නම ඕනේ. ඊට කලින් මහ මැතිවරණයක් එනවා කියන එක ජනාධිපතිවරණය කල්දැමීමට හෝ ජනාධිපතිවරණයේ දින වෙනස් වීමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට හෝ ජනමත විචාරණයකට හෝ හේතුවක් නෙවෙයි. තියෙන්නේ ජනාධිපතිවරණයට පෙර මේක තියයිද, නැද්ද කියන එක. ජනාධිපතිවරණයක් තිබ්බත්, මහ මැතිවරණයක් තිබ්බත් රටේ මිනිස්සු පිපාසයකින් ඉන්නවා තුන්වැනි ව්‍යවස්ථාවේ තියෙන තමන්ගේ පරමාධිපත්‍ය ඡන්ද බලය ක්‍රියාත්මක කරන්න. මේක විකෘති පාලනයක්. මේ විකෘති පාලනය තුළ රටේ දේශපාලනය විනාශයි. සෞඛ්‍ය පද්ධතිය, විදේශ ප්‍රතිපත්තීන්, ප්‍රවාහනය විනාශයි. විනාශ නොවිච්ච තැනක් නෑ. ආර්ථිකය විනාශයි. මිනිස්සුන්ගේ පොකට් එකට ලැබෙන මුදල්වලින් ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තියෙනවා. මේ කරුණු නිසා අරගලයෙන් ඇතිවෙච්ච ප්‍රතිඵලත් මත මිනිස්සු ප්‍රශ්න කරනවා. බය නැතුව නිලධාරීන්ව ප්‍රශ්න කරන තත්ත්වයට පුරවැසියෝ මේ රටේ හදලා තියෙනවා.



නීතිඥ
හේමක
සේනානායක

